# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1996 අංක 10 දරන
# පළාත්බද මහාධිකරණ
# (විශේෂ විධිවිධාන) පනත

---

[සහතිකය සටහන් කළේ මැයි මස 08 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1996 මැයි මස 01 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : ශත 60 යි.

තැපැල් ගාස්තුව : රු. 2.00 යි.

# 1996 අංක 10 දරන පළාත් බද මහාධිකරණ (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 1996 මැයි මස 08 වන දින]

එල්. ඩී.—ඕ. 48/91

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පිහිටුවනු ලද මහාධිකරණ විසින් ඇතැම් සිවිල් නඩු සහ කාරණා විභාග කිරීමේ හා තීරණය කිරීමේ අධිකරණ බලය ක්‍රියාත්මක කිරීම පිණිස විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1996 අංක 10 දරන පළාත්බද මහාධිකරණ (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. කෙටි නාමය.

2. (1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පළාතක් සඳහා පිහිටුවන ලද සෑම මහාධිකරණයකට ම, ඒ මහාධිකරණය සම්බන්ධයෙන් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන යම් දිනයක සිට බලපැවැත්වෙන පරිදි, මේ පනතේ පළමුවන උපලේඛනයේ සඳහන් සියලු නඩු, ඉල්ලීම් සහ නඩු කටයුතු, ඒ නඩුවල විත්තිකාර පාර්ශ්වකරු හෝ පාර්ශ්වකරුවෝ පදිංචිව සිටින්නේ හෝ නඩු නිමිත්ත පැන නැගුනේ නැතහොත් ක්‍රියාවේ යෙදවීමට අපේක්ෂා කරනු ලබන ගිවිසුමට ඇතුලත් වූයේ හෝ 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ඉල්ලීම් හා නඩු කටයුතු සම්බන්ධයෙන් වූ විට සමාගමේ ලියාපදිංචි කාර්යාලය පිහිටියේ ඒ මහාධිකරණය පිහිටුවනු ලද පළාත ඇතුලත නම්, ලිඛිත නීතිය මගින් විධිවිධාන සලස්වා ඇති ආකාරයට ඒ නඩු සම්බන්ධයෙන් තනි අධිකරණ බලය ද, ඒ නඩු සංජානනය කිරීමට ද, විභාග කොට තීරණය කිරීමට සම්පූර්ණ බලය ද, තිබිය යුතු ය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පිහිටුවනු ලද මහාධිකරණයේ සිවිල් අධිකරණ බලය.

(2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පිහිටුවනු ලද මහාධිකරණයක් සම්බන්ධයෙන් (1) වන උපවගන්තිය යටතේ නියමයක් කරන ලද අවස්ථාවක, ඒ උපවගන්තිය යටතේ ඒ මහාධිකරණය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි අධිකරණ බලය—

(අ) ඒ මහාධිකරණය, බස්නාහිර පළාත සඳහා පිහිටුවන ලද මහාධිකරණය නම්, කොළඹ දී සහ අග්‍රවිනිශ්චයකාරවරයාගේ එකඟත්වය ඇතිව, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන

බස්නාහිර පළාත ඇතුළත වෙනත් යම් ස්ථානයක දී හෝ පවත්වනු ලබන මහාධිකරණය විසින්, ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය ; නැතහොත්

(ආ) ඒ මහාධිකරණය වෙනත් යම් පළාතක් සඳහා පිහිටුවන ලද මහාධිකරණය නම්, අග්‍රවිනිශ්චයකාරවරයාගේ එකඟත්වය ඇතිව, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ඒ පළාත ඇතුළත යම් ස්ථානයක දී පවත්වනු ලබන මහාධිකරණය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(3) බස්නාහිර පළාත සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පිහිටුවන ලද මහාධිකරණයට, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන යම් දිනයක සිට බලපැවැත්වෙන පරිදි, ලිඛිත නීතිය මගින් විධිවිධාන සලස්වා ඇති ආකාරයට මේ පනතේ දෙවන උපලේඛනයේ දක්වා ඇති සියලු කාරණා සම්බන්ධයෙන් තානි අධිකරණ බලය ද ඒ කාරණා සංජානනය කිරීමට ද, ඒ කාරණා විභාග කොට තීරණය කිරීමට සම්පූර්ණයෙන් බලය ද, තිබිය යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයේ දින සිට බලපැවැත්වෙන පරිදි, බස්නාහිර පළාත සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පිහිටුවන ලද මහාධිකරණය විසින්, ඒ වගන්තිය යටතේ ක්‍රියාත්මක කරනු ලැබිය හැකි අධිකරණ බලය, කොළඹ දී සහ අග්‍රවිනිශ්චයකාරවරයාගේ එකඟත්වය ඇතිව ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන බස්නාහිර පළාත ඇතුළත වෙනත් යම් ස්ථානයක දී හෝ පවත්වනු ලබන මහාධිකරණය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

3. මේ පනතේ පළමුවන උපලේඛනයේ හෝ දෙවන උපලේඛනයේ සඳහන් යම් නීතියක, ඒ උපලේඛනවල දක්වා ඇති යම් කාරණයකට අදාළව යම් අධිකරණයක් පිළිබඳව එකී යම් නීතියක් යටතේ සිදු කරනු ලැබූ යම් වරදක් පිළිබඳව නඩු විභාගයක් හා සම්බන්ධ අධිකරණයක් පිළිබඳ සඳහනක් තොවන සඳහනක් ඇත්තා වූ අවස්ථාවක දී ඒ සඳහන, අමාත්‍යවරයා විසින් අවස්ථාවෝචිත පරිදි, 2 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ කරනු ලබන නියමයක සඳහන් දින සිට, ඒ නියමයේ සඳහන් පළාත සම්බන්ධයෙන් වන විට ඒ පළාත සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද මහාධිකරණයට කරන ලද සඳහනක් ලෙස හෝ, 2 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ කරනු ලබන නියමයක් මගින් නියම කරනු ලබන දිනයක සිට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ බස්නාහිර පළාත් සඳහා පිහිටුවන ලද මහාධිකරණයට සම්බන්ධයෙන් වන විට හෝ අවස්ථාවෝචිත පරිදි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද මහාධිකරණයට හෝ බස්නාහිර පළාතේ මහාධිකරණයට කරන ලද සඳහනක් ලෙස සලකනු ලැබිය යුතු ය.

නඩු ගාස්තු.

4. නඩු ගාස්තු ප්‍රදානය කිරීමේ කාරණය සම්බන්ධයෙන් (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහයේ XXI වන පරිච්ඡේදයේ විධිවිධාන, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පිහිටුවන ලද මහාධිකරණයක් සම්බන්ධයෙන් අදාළ විය යුතු අතර, තත් කාර්යය සඳහා ඒ සංග්‍රහයේ දෙවන උපලේඛනයේ I වන කොටසෙහි "දිසා අධිකරණ" සම්බන්ධයෙන් වූ සඳහන් කිරීම, "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පිහිටුවන ලද මහාධිකරණ සම්බන්ධයෙන් ද, දිසා අධිකරණය සම්බන්ධයෙන් ද" වූ සඳහන් කිරීමක් වූවාක්මෙන් කියවා තේරුම් ගනු ලැබිය යුතු ය.

අභියාචනා කිරීමේ අයිතිය.

5. (1) තමා පාර්ශ්වකරුවෙකු වන යම් නඩුවක දී, නඩු කටයුත්තක දී හෝ කාරණයක දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පිහිටුවන ලද මහාධිකරණයක් විසින් ප්‍රකාශයට පත් කරන ලද යම් නඩු තීන්දුවකින් අතෘප්තියට පත් සෑම තැනැත්තකු විසින්, ඒ නඩු තීන්දුවට විරුද්ධව, සිද්ධිමය හෝ නීතිමය යම් දෝෂයක් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(2) තමා පාර්ශ්වකරුවකු වන හෝ පාර්ශ්වකරුවකු වීමට බලාපොරොත්තු වන යම් නඩුවක දී, නඩු කටයුත්තක දී හෝ කාරණයක දී 2 වන වගන්තිය යටතේ වූ එහි අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමෙහි ලා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පිහිටුවන ලද මහාධිකරණයක් විසින් කරන ලද යම් ආඥාවකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ අවසරය පළමුව ඇතිව සහ ලබාගෙන, සිද්ධිමය හෝ නීතිමය යම් දෝෂයක් නිවැරදි කිරීම සඳහා ඒ ආඥාවට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තියේ "නඩු තීන්දුව" සහ "ආඥාව" යන යෙදුම්වල (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහයේ 754(5) වන වගන්තියේ, පිළිවෙලින් ඒවාට දී ඇති අර්ථම ඇත්තේ ය.

අභියාචන සම්බන්ධයෙන් කාර්ය පටිපාටිය

6. ශ්‍රේෂ්ඨාධිකරණය වෙත කරනු ලබන සෑම අභියාචනයක් ම, සහ 5 වන වගන්තිය යටතේ අභියාචනය කිරීම පිණිස අවසර ගැනීම සඳහා වූ සෑම ඉල්ලීමක් ම, (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහයේ LVIII වන පරිච්ඡේදයෙහි නියමිත කාර්ය පටිපාටියට හැකි තාක් දුරට අනුකූලව කරනු ලැබිය යුතු ය.

අධිකරණ බලය සම්බන්ධයෙන් විරෝධතාව.

7. දිසා අධිකරණයක දී අය කර ගනු ලැබිය හැකි වූ යම් ණයක්, ඉල්ලීමක්, හෝ අලාභයක් සම්බන්ධයෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පිහිටුවන ලද යම් මහාධිකරණයක, යම් නඩුවක් හෝ නඩු කටයුත්තක් ආරම්භ කරනු ලැබුවහොත්, ඒ නඩුවේ හෝ නඩු කටයුත්තෙහි පැමිණිලිකරුට සාවරාකාරවූ හෝ නඩු ගාස්තු කිසිවක් ලැබීමට හිමිකමක් නොමැති නමුත්, ගාස්තු සම්බන්ධයෙන් යුක්තිය අනුව අවශ්‍ය වන යම් ආඥාවක් කිරීමට විනිශ්චයකාරවරයාට බලය ඇත්තේ ය.

විත්ති වාචකය හෝ හරස් ඉල්ලීම අධිකරණයේ අධිකරණ බලය ඉක්මවා යන අවස්ථාවක.

8. යම් දිසා අධිකරණයක් ඉදිරියෙහි වූ යම් නඩු කටයුත්තක දී විත්තිකරුගේ යම් විත්ති වාචකයක් හෝ හරස් ඉල්ලීමක් අධිකරණයේ අධිකරණ බලය ඉක්මවන්නා වූ කාරණයක් සම්බන්ධයෙන් වන අවස්ථාවක මත භේදයට තුඩු දුන් කාරණය පැමිණිලිකරුගේ ඉල්ලීමට සහ ඒ සම්බන්ධයෙන් වූ විත්තිවාචකයට අදාළ වන තාක් දුරට, ඒ මතභේදයට තුඩුදුන් කාරණය සහ හරස් ඉල්ලීම සම්බන්ධයෙන් සුදුස්සක් කිරීමෙහිලා අධිකරණය සතු බලය හෝ යුතුකම කෙරෙහි ඒ විත්තිවාචකය හෝ හරස් ඉල්ලීම බල නොපෑ යුතු ය.

එසේ වුවද, එවැනි යම් කාරණයක දී, අභියාචනාධිකරණය විසින් හෝ එහි යම් විනිශ්චයකාරවරයකු විසින්, නඩු කටයුතුවල යම් පාර්ශ්වකරුවකුගේ ඉල්ලීම පිට, ඒ නඩු කටයුතු පවරනු ලැබූ අධිකරණයෙන් මත භේදයට භාජනය වූ සම්පූර්ණ කාරණය පිළිබඳව අධිකරණ බලය ඇති වෙනත් යම් අධිකරණයකට ඒ සම්පූර්ණ නඩු කටයුත්ත මාරු කරන ලෙස ආඥා කිරීම සුදුසු යයි කල්පනා කරන්නේ නම් එසේ කිරීම නීත්‍යානුකූල වන්නේ ය. එවැනි අවස්ථාවක දී ඒ නඩු කටයුතු සම්බන්ධයෙන් වූ නඩු වාර්තාව අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින්, ඒ ආඥාව මගින් නඩු කටයුත්ත මාරු කරනු ලැබූ අධිකරණය වෙත යැවිය යුතු අතර, ඉක්බිතිව ඒ නඩු කටයුත්ත ඒ අධිකරණයේ මුලින්ම ආරම්භ කරන ලද්දක් සේ සලකා ඒ අධිකරණය විසින් අඛණ්ඩව කර ගෙන යා යුතු ය.

නඩුවේ වටිනාකම අධිකරණ බලය ඉක්මවා ඇති අවස්ථාවක.

9. යම් දිසා අධිකරණයක පවරා ඇති නඩුවක වටිනාකම, 2 වන වගන්තිය යටතේ අධිකරණ බලය ක්‍රියාත්මක කරන, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ග ව්‍යවස්ථාව මගින් පිහිටුවන ලද මහාධිකරණයක පැවරිය යුතුව තිබූ නඩුවක් වන බවට සාක්ෂි ඇති අවස්ථාවක විනිශ්චයකාරවරයා විසින් ඒ කරුණ සටහන් කර, ඒ අනුව ආඥාවක් කළ යුතු අතර, ඉන් අනතුරුව, ඒ නඩුව අධිකරණය වෙත යවනු ලැබිය යුතු ය.

අන්තර්කාලීන විධිවිධාන.

10. 2 වන වගන්තියේ (1) වන උපවගන්තිය හෝ (3) වන උපවගන්තිය යටතේ ආඥාවක් කරනු ලැබුවේ යම් දිනයක ද, ඒ දිනයට ඉහතින්ම වූ දිනයේ දිසා අධිකරණයක විනිශ්චයට භාජනව පවත්නා වූ ද, ඒ ආඥාවේ විධිවිධාන ප්‍රකාර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පිහිටුවන ලද මහාධිකරණයක් විසින් විභාග කොට තීරණය කිරීමේ අධිකරණ බලය ඇත්තා වූ ද, සියලු සිවිල් නඩු, නඩු කටයුතු හෝ කාරණා ඒ මහාධිකරණය වෙත යවනු ලැබිය යුතු අතර, ඒ මහාධිකරණයට ඒ සිවිල් නඩු, නඩු කට

යුතු හෝ කාරණා සංජානනය කිරීමට ද, විභාග කොට තීරණය කිරීමට ද, නැතහොත් දිගට ම පවත්වා ගෙන ගොස් අවසන් කිරීමට ද අධිකරණයට බලය ඇත්තේ ය.

එසේ වුව ද, 2 වන වගන්තියේ (1) වන උපවගන්තිය හෝ (3) වන උපවගන්තිය යටතේ එවැනි ආඥාවක් කරන ලද දිනයට ඉහතින්ම වූ දිනයේ දී දිසා අධිකරණයේ සාක්ෂි ඉදිරිපත් කිරීම ආරම්භ වී ඇති එවැනි යම් සිවිල් නඩුවක්, නඩු කටයුත්තක් හෝ කාරණයක්, එකී දිසා අධිකරණය විසින් විභාග කොට තීරණය කරනු ලැබිය යුතු ය.

**යම් අනනුකූලතාවක් ඇති වූ විට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.**

**11.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

**පළමුවන උපලේඛනය (2 (1) වන වගන්තිය)**

(1) 1990 අංක2 දරන ණය ආපසු අය කර ගැනීමේ(විශේෂ විධිවිධාන) පනත යටතේ පවරා ඇති නඩු හැරෙන්නට රුපියල් එක් මිලියනයක් හෝ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනයක් මගින් අමාත්‍යවරයා විසින් කලින් කල නියම කරනු ලබන වෙනත් යම් මුදලක් ඉක්මවන යම් මුදල් ප්‍රමාණයක ණය මුදලක් අලාභයක් හෝ ඉල්ලීමක් සම්බන්ධයෙන් වන්නාවූද (බැංකු කටයුතු, වෙළෙඳ බඩු අපනයනය හෝ ආනයනය, සේවා, නැව් කුලී, රක්ෂණය, වෙළෙඳ නියෝජ්‍යත්වය, වෙළෙඳ ව්‍යවහාරය සහ යම් වෙළෙඳ ලියවිල්ලක් අර්ථ නිරූපණයට අදාළ නඩු නිමිති ද ඇතුළුව, වාණිජ ගනුදෙනු කිරීම් වලින් උද්ගතවන්නා වූ නඩු නිමිති හා සම්බන්ධයෙන් වූ ද සියලු නඩු.

(2) 1932 අංක 17 දරන සමාගම් පනතේ 31, 51, 131, 210 සහ 211 වන වගන්ති යටතේ වූ සියලු ඉල්ලීම් සහ නඩු කටයුතු.

(3) 1979 අංක 52 දරන බුද්ධිමය දේපළ නීති සංග්‍රහය පනත යටතේ වූ සියලු නඩු කටයුතු. (දෙවන උපලේඛනයෙහි (2) විෂයාංකයෙහි සඳහන් නඩු කටයුතු හැර).

**දෙවන උපලේඛනය (2 (3) වන වගන්තිය)**

(1) සමාගම් රෙජිස්ට්‍රාර්වරයාට විරුද්ධව හෝ 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට විරුද්ධව ඉන්ජන්ෂන් තහනමක් පැමිණිල්ලෙහි අයැද සිටින්නා වූ සියලු නඩු.

(2) 1979 අංක 52 දරන බුද්ධිමය දේපළ නීති සංග්‍රහය පනත යටතේ කොළඹ දිසා අධිකාරණයේ විභාග කිරීමට නියම කර ඇති සියලු නඩු කටයුතු.

(3) 1987 අංක 1 දරන සාධාරණ වෙළෙඳ කොමිෂන් සභා පනතේ 17 වන වගන්තිය යටතේ අභියාචනාධිකරණය වෙත කරනු ලැබිය යුතු සියලු අභියාචනා.

[illegible]

11. [illegible]

[illegible]

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 යි. (විදේශීය) රු. 1,160 යි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත [illegible] ම්බර් මස 15 වැනි දිනට ප්‍රථම මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය